සැ. යු. - 2021.03.05 දින අංක 2,218 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,219 - 2021 මාර්තු මස 12 වැනි සිකුරාදා - 2021.03.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 444 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 451 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ''මාතර සමය'' සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.”*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www. *documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා **සීමිත සහ විවෘතව** බඳවා ගැනීමට නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2021.04.12 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*විවෘත බඳවා ගැනීම් :*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *ශ්‍රේණිය* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01 | ගිනිභට | 03 | - | Rs. 1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 29,540 - 7x300 - 27x370 - රු. 41,630 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 29,540 , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |

01. **ගිනිභට තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :**

*සේවා ගණය :* නියාමන සේවා

*අධ්‍යාපන සුදුසුකම් :* එකවරක දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුත අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවක දී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් ද සමත්ව තිබිය යුතුය.

*කායික සුදුසුකම් :*

(i) උස සෙ. මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය.)

(ii) සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.

(iv) කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා: පච්ච කොටා තිබීම වැනි)

*වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුයි.

(iii) අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

(iv) යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වර්තාවකින් සනාථ කළ යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* පත්‍රයේ සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වයස :*

**අවම සීමාව** - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

**උපරිම සීමාව** - අවුරුදු 24 ට නොවැඩි විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිභටයින් වශයෙන් තෝරාගනු ලැබේ.

(ii) පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිභටයින් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(iii) පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

(iv) සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

(v) පුහුණු කාලසීමාව තුළ මාසිකව රු. 10,000 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(vi) පුහුණු කාල සීමාව තුළ දී කිසිම ආධුනික ගිනිභටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(vii) පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත් කිරීම් බලධාරියා සමග රු. 500,000 ක වටිනාකමින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේ දී අත්සන් කළ යුතුය.

(viii) ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

(ix) ගිනිභට තනතුර සඳහා පත්වීම ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

*ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය :** (ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.) | පැය 01 | 100 | 40 |

***වෘත්තීය පරීක්ෂණය :***

ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)

මෙම පරීක්ෂණයට සහභාගීවීමේ දී ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| *දරා ගැනීමේ හැකියාව :*<br>(i) දිවීම (කිලෝමීටර් 01 ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>(ii) ඩිප්ස් ගැසීම (නිවැරදිව ඩිප්ස් 25 ක් ගැසීමට ගත වන අවම කාලය)<br>(iii) බර ඔසවාගෙන යෑම | 60 | 36 |
| ***සමබරතාවය :***<br>(i) ඉනිමගේ යාම<br>(ii) කඹයෙන් බැසීම | 40 | 24 |

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබාදෙනු නොලැබේ.

*රැකියා විස්තරය :*

(i) ගිනි නිවීම සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම් හා පුහුණු කිරීම්

(ii) ගිලන් රථ සේවා, තාක්ෂණික සේවා, සන්නිවේදන රාජකාරි, ප්‍රභූ ආරක්ෂක සේවා සහ ගිනි නිවාරණ පොරොත්තු රාජකාරී.

(iii) හදිසි ආපදා, හදිසි මුදා ගැනීම් සහ විවිධ මානුෂීය අවශ්‍යතාවන් සඳහා වන මෙහෙයුම්

(iv) ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සියලුම කාර්යයන්

(v) සේවාවේ ඉහළ නිලධාරීන් විසින් පවරනු ලබන රාජකාරි කටයුතු යටතට ගැනෙන සියලුම රාජකාරී

(vi) තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝගවලට අනුව තම කාර්යයන් ඉටු කිරීම

(vii) ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටු කිරීම

*තනතුරට අදාළ වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කළ යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත වීම

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

*තනතුරෙහි ස්වභාවය :* ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය

*සීමිත බඳවා ගැනීම් :*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *ශ්‍රේණිය* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර පරිපාලක | 02 | III | MN I-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 මෙම වැටුප් පරිමාණයේ 4 වන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. |
| 02 | සෞඛ්‍ය පරිපාලක | 01 | | |

**01/02. වැඩ ක්ෂේත්‍ර පරිපාලක III/සෞඛ්‍ය පරිපාලක III**

*අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

*පළපුරුද්ද* :- පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය අයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.

*කායික සුදුසුකම්* :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

*වෙනත්* -

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

| | | |
|---|---|---|
| *වයස :* | අවම සීමාව<br>උපරිම සීමාව | දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ. |

**බඳවා ගැනීමේ ක්‍රමය :**

01. *ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය | 100 | 40% |

**සටහන** - ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබාගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

02. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | 25 |
| වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම | 10 | |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

**සටහන** - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.

*තනතුරේ ස්වභාවය :*

- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.
- පත්වීම ලබා වසර 05ක් ඉක්මවීමට පෙර අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
- වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**ඉහත විවෘත සහ සීමිත තනතුරු සඳහා පොදු කරුණු**

*භාෂා ප්‍රවීණතාවය :*

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා. ප. ච. 01/2014 චක්‍රලේඛයේ හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලටද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

නාගරික කොමසාරිස් (රා. ඉ.)
මහා නගර සභාව,
මීගමුව.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**..............................................තනතුර (සීමිත/විවෘත) සඳහා අයදුම්පත්‍රය**
**මීගමුව මහා නගර සභාව**

1. මුලකුරු සමග නම :……………………………………………………………
2. සම්පූර්ණ නම :………………………………………………………
3. ජාතික හැඳුනුම්පත් අංකය :……………………………………………………
4. ස්ථිර පදිංචි ලිපිනය :………………………………………………………
5. දුරකථන අංකය :………………………………………………………
6. තැපැල් ලිපිනය :………………………………………………………
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :……………………………………………………
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :……………………………………………………
9. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :……………………………………………………
10. උපන් දිනය :…………………………………………………
    2021.04.12 දිනට වයස :…………………………………………
11. විවාහක/අවිවාහක බව :……………………………………………
12. අධ්‍යාපන සුදුසුකම් : (ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
13. පළපුරුද්ද : (ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
14. වෘත්තීය සුදුසුකම් : (ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
15. වෙනත් සුදුසුකම් :………………………………………………………
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග :…………………………………………………………

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට , බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් , යටත් වන බව හොඳාකාරවම දනිමි.

………………………
අයදුම්කරුගේ අත්සන

දිනය :………………

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ..........................................................................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ .........................................................වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය තෝරා පත්වුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

………………………
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :………………………
තනතුර:………………………
දිනය:………………………

03-524

## මිනුවන්ගොඩ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට විවෘත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

<table>
<tr><th>අනු. අංකය</th><th>තනතුරු නාමය</th><th>තනතුරු සංඛ්‍යාව</th><th>වැටුප් කේත අංකය</th><th>වැටුප් පරිමාණය</th><th>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</th></tr>
<tr><td>01</td><td>වෙළඳසැල් පරිපාලක III ශ්‍රේණිය</td><td>01</td><td>MN1/2016 (රා.ප.ච.03/ 2016 ට අනුව)</td><td>රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540<br>(බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.)</td><td>බඳවා ගැනීමේ ක්‍රමය :<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් වත් (01) (සාමාන්‍ය පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>වෘත්තීය සුදුසුකම් : අදාළ නැත<br>පළපුරුද්ද - අදාළ නැත<br>කායික සුදුසුකම් :<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>ලිඛිත විභාගය :
<table>
<tr><th>විෂයයන්</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
</table>
සටහන : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙළ අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩුව පුරවනු ලැබේ.<br>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :<br>මෙහි දී ලකුණු ලබාදෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.</td></tr>
</table>

*2. පොදු සුදුසුකම් :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(2) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(3) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(4) අවම වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
(5) උපරිම වයස් සීමාව - අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(6) තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

4. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2021.04.01 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මිනුවන්ගොඩ නගර සභාව, මිනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා නොබලන අතර ඒ බව ලිඛිතව දැනුම් දෙනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. ග්‍රාම නිලධාරි සහතිකය.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේ දී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියළු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතුවේ.

පී. ඒ. එස්. එස්. සඳරුවන්,
ලේකම්,
මිනුවන්ගොඩ නගර සභාව,
මිනුවන්ගොඩ.

2021 පෙබරවාරි මස 24 වැනි දින,
නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ ............................................. තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :.........................................
2. සම්පූර්ණ නම :.........................................
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.........................................
4. ස්ථිර ලිපිනය :.........................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................
6. ස්ත්‍රී/පුරුෂභාවය :.........................................
7. උපන් දිනය : අවුරුද්ද :.................. මාසය :............... දිනය :...............
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :.........................................
9. විවාහක/අවිවාහක බව :.........................................
10. දුරකථන අංකය :.........................................
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත ඇමිණිය යුතුය.)

12. වෙනත් සුදුසුකම් :......................................
13. සේවා පළපුරුද්ද :......................................
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

.
......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.................................

**අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ............................................................................ මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා පත්වුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව හා *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සතුටුදායක සේවා කාලයක සපුරා ඇති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

..........................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :.....................................................................
තනතුර :.....................................................................
දිනය :.....................................................................

03-347

---

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහා නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහා නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහා නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2020.11.05 දින ඊ 05 යටතේ දරන සභා අනුමැතිය අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මෙම මාර්ගයට අදාළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුලදී තමන්ගේ විරෝධතාවය සාක්ෂි ඇතිව ලිඛිතව මහා නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහා නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
බදුල්ල.

2021 පෙබරවාරි මස 22 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන්ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම්පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| | | (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට) | (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට) | (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට) | (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට) | | |
| 01 | බදුල්ල බණ්ඩාරවෙල කැටවල අතුරු මාර්ගය | වම<br>කේ. එම්. ඒ. රැන්ඩොල් මහතාගේ නිවස අසල<br><br>වරිපනම් අංක : 28<br><br>දකුණ<br>එම්. ඩී. එල්. රැන්ඩොල් මියගේ නිවස අසල<br><br>වරිපනම් අංක : 16 | වම<br>පියසිරි විතාරණ මහතාගේ නිවස අසල<br><br>වරිපනම් අංක: 16/1<br><br>දකුණ :<br><br>පියසිරි විතාරණ මහතාගේ නිවස අසල<br><br>වරිපනම් අංක : 16/1 | 28<br><br>16/5<br><br>16/1 | 16<br><br>16/7<br><br>16/1 | 120 | 3.03 |

03-249

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02 ) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

මිනින්දෝරු සැලැස්ම රහිත

| අනු. අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 76 ඉඹුල්දෙණිය | හීයවල ඉහළහේන මාර්ගය | නිකාංග ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය | ඉහළහේන වත්ත | කේ. පී. රේණුකා දමයන්ති<br>ඩී.ජී. කපිලරත්න | බී. ජී. සුනිල් ගුණතිලක<br>පී. ජී. නිලන්ත සමන් කුමාර<br>එස්. එස්. විජයවර්ධන<br>ඒ. ආර්. සමරනායක කුමුදුනී රම්‍යලතා<br>එන්. ජී. ඒ. සම්පත් ජයරත්න<br>එන්. ජී. සිරිල් ජයරත්න | 100 | 05 |

මිනින්දෝරු සැලැස්ම සහිත


| අනු. අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 02 | 45 දෙල්ගහපිටිය | සමගි මාවත | කුඩා බණ්ඩා මහතාගේ නිවස අසලින් | රොෂාන් විජේරත්න මහතාගේ නිවස අසලින් | ආර්. ඩබ්. පී. ජී. ආර්.සෙනරත්<br>ගීතානි මීවතුර<br>නිරෝෂණී සමන් කුමාර<br>ටී. ආර්. දිවාකර<br>ඒ. එම්. ආර්. කුමාරිහාමි | කේ. ඒ. එම්. රෝහිත වීරකෝන්<br>ඩබ්. එම්. කුඩාබණ්ඩා<br>යූ. ජී. ආර්. එස්. දයාරත්න<br>ඩී. ජී. රොෂාන් කුමාර විජේරත්න<br>ඩී. ජී. සංජීව කුමාර විජේරත්න | 820 | 10 |
| 03 | 42 උඩඅළුදෙණිය | උඩඅළුදෙණිය රතුකුරුස මාර්ගයේ 1 වැනි පටුමග | රතුකුරුස මාර්ගයේ I වැනි පටුමග | උඩුපිටිය වත්ත | ආර්. ඒ. බණ්ඩාරනායක<br>ආනන්ද විජේරත්න | එස්. එම්. කසුන් හිරන්ත<br>ඩබ්. කේ. ජී. ඒ. පී. නන්දසේන<br>බී. එච්. බන්දුල පුෂ්පකුමාර | 110 | 08 |

සභාපති,<br>
උඩුනුවර ප්‍රාදේශීය සභාව,<br>
ගෙලිඔය.

D.A.Ratnayeke
Licensed Surveyor & Leveller
No.212/A
Polgahaange
Weligalla

PLAN No:3282






Reference

| | |
|---|---|
| B | Bank |
| LF | Live Fence |
| CP | Concreet Post |
| L | Land mark |
| Road(PS) | Road(Pradeshiya-<br>-Sabawa) |

මුල් පිටපත හා සැසඳෙන බවට
සහතික කරමි

ප්‍රධාන කළමනාකරණ සහකාර
ප්‍රාදේශීය සභාව

Scale : 1:2000

# PLAN

of an allotment of Land called
Part of Panderugahamulahena & Koholangodahena
Situated at Polgahaange Village
Delgahapitiya G.S.Division, Udunuwara Pradeshiya Sabawa
Gangapalata Korale of Udunuwara D.S.Division

## KANDY DISTRICT
## CENTRAL PROVINCE

Surveyed in: 05/08/2020

Note.


Distance from A to B..................210.0 meters

| Lot No: | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Ha. | A. | R. | Pa. | |
| 1 | 0.0650 | 0 | 0 | 25.5 | Road (10 feet Wide) |
| Total | 0.0650 | 0 | 0 | 25.5 | |

D.A. Ratnayake
Registered Licensed Surveyor
No 212/A, Polgahaanga
Weligalla

T.B.S. Sangarandeniya
Registered Licensed Surveyor
No. 61–A, Weralugasanga,
Dabakotuwa,
Kengalla.
Reg. No. 19790243

PLAN No: 18578/A




Scale 1 : 500

# PLAN

OF

REDCROSS ROAD, 1 ST LANE

Situated at

G.N.division No. 42, Uda Aludeniya

Uda Aludeniya Village

Within the Pradeshiya sabha Limits of Udunuwara

in Gangapalatha Korale of Udunuwara D.S.Division

KANDY DISTRICT

CENTRAL PROVINCE

Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.0085 | 0 | 0 | 3.36 | Road (8 Feet width) |
| Total | 0.0085 | 0 | 0 | 3.36 | |

Length of "A" to "B" = 32 m (105 Feet)

1) Survey as the Request of Chief Incumbent of Uda Aludeniya Raja Maha Viharaya and Owners of the Land in both side of Road

2) Boundaries pointed out by owners of the Land in both side of road.

Surveyed on 24th of January 2021.

T.B.S. SANG...
Registered Licensed Survey..
Reg. No. 19790243

## මාතර මහා නගර සභාව

### 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි වේ

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කාංචනා කේ. තල්පාවිල,
මාතර මහා නගර සභාව.

2021 ජනවාරි මස 26 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අලුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තරය* |
|---|---|---|---|---|---|
| 01 | මාතර මහා නගර සභාව | මාතර | මාතර උයන්වත්ත පිලදුව පාරේ 2 වන අතුරු මාර්ගය | දිවංගත චමින්ද කුමාර රණසිංහ මාවත | ආරම්භය - පිලදුව පාර<br>අවසානය - එන්.ඒ. රත්නායක මයාගේ නිවස |

03-301

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.